ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

නො.330,තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
இலக்கம் 330இ தலவத்துகொட வீதிஇ மதிவெலஇ ஸ்ரீ ஜயவாதனபுர கோட்டை
No 330. Thalawathugoda Rd. Madiwela. Sri Jayawardanapura Kotte.

E-Mail- ncpa@childprotection.gov.lk
Web- www.childprotection.gov.ik

දුරකථන - T.P - 0112778912, 0112778913
FAX - 0112778915

මගේ අංකය / My No / எனது இலக்கம் - NCPA/Ethics/ 02

දිනය - Date - திகதி - 2025/10/........

## අභ්‍යන්තර චක්‍රලේඛ අංක 01/2025

**අධ්‍යක්ෂ ජනරාල්,**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,**
**සියලුම අධ්‍යක්ෂවරුන්,**
**සියලුම සහකාර අධ්‍යක්ෂවරුන්,**
**සියලුම නිලධාරීන්,**
**සියලුම දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්,**
**සියලුම දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරීන්,**
**සියලුම ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්,**
**සියලුම නිලධාරීන් හා සේවකයින්,**

## ළමයින් සමඟ කටයුතු කරන නිලධාරීන් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම (Ethical Guidelines for Officers Working with Children)

### පූර්විකාව (Preamble)

මෙම ආචාරධර්ම පද්ධතිය 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 15(එ) සහ (ඒ) ප්‍රකාරව සකස්කර ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දැක්ම ප්‍රකාරව ළමුන් සඳහා ළමා හිතකාමී හා සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කරමින්, ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් සුරක්ෂිත කිරීමේ මෙහෙවර පෙරදැරිව සුරක්ෂිත ළමයෙකු බිහි කිරීම ළමා ආරක්ෂක නිලධාරීන් සතු වගකීමකි. මෙකී වගකීම ඉටුකර ගැනීමට යාමේදී සිදු විය හැකි ආචාරධර්ම බිඳ වැටීම් තුලින් නිලධාරියා හා ළමා ආරක්ෂක පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා මෙම ආචාරධර්ම පද්ධතිය ඔබට පිටුවහලක් වනු ඇත.

මෙම ආචාරධර්ම පද්ධතිය 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත, 1939 අංක 48 දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත, ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2019), ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පැමිණිලි මෙහෙයුම් මාර්ගෝපදේශය, ඇතුළු දේශීය අණපනත් හා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය (UNCRC,1989), ළමා ආරක්ෂාව පිළිබඳ අවම සම්මත ප්‍රමිතීන් (CPMS,2019), දරුවන් සම්බන්ධයෙන් ආචාරධර්ම පර්යේෂණයන් සම්බන්ධ මාර්ගෝපදේශය (ERICGuidelines,2013) ළමයින්ගේ ධාරිතා සංවර්ධනය (Lansdown,G.2014), දරුවන්ගේ ආරක්ෂිතයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මතයන් (Keeping Children Safe 2014). දරුවන්ගේ

ආරක්ෂාව පිළිබඳ මන්රෝගේ වාර්තාව (Munro, E.(2011). අන්තර් සංස්කෘතික සම්පත් සංකල්ප සහ මෙහෙයුම් රාමුව (UNESCO. (2018). දරුවන් සම්බන්ධ ඡායාරූප සහ පණිවුඩ භාවිතය පිළිබඳ අචාරධර්ම මාර්ගෝපදේශය (UNICEF. (2019). යන ජාත්‍යාන්තර ප්‍රමිතීන් හා වාර්තා ද ඇතුළත් කර ගෙන ඇත.

## 01.හැඳින්වීම( Introduction)

යම් කණ්ඩායමක හෝ සමාජයක් සංවර්ධනය හා සුරක්ෂිතතාවය සඳහා පුරුෂාර්ථ වටිනාකම්, ප්‍රමිතීන්, සම්මතයන් හෝ පොදු ධර්මතා පැවතීම අත්‍යාවශ්‍ය කරුණකි. පුරුෂාර්ථයක් හෝ වටිනාකමක් (Values) යනු **''යම් යම් දේ, කාරණා, අදහස්, සංකල්ප, හෝ සිද්ධි විවරණය කොට ඒවායේ හොඳ හෝ නරක තුලනය කරන්නට එනම් ඒවායේ නිවැරදි බව, වටිනාකම, වැදගත්කම, හරවත්කම, අගය කරන්නට දරණ වැයමේ ප්‍රතිඵලයයි. පුරුෂාර්ථ වටිනාකම් ඇති කල් හී පුද්ගලයන් හෝ සමූහයන් මේ අන්දමින් කටයුතු කළ යුතු යැයි වටහා ගනී.'' (රත්නපාල නන්දසේන, 2003.p.17)**

ධර්මතා යනු **''පුරුෂාර්ථයන් එදිනෙදා ක්‍රියාවට නගන චර්යා විදියයි.'' (රත්නපාල නන්දසේන, 2003.p.17)** ධර්මතා ජන චර්යා (Folkways), ගණ චර්යා (Mores), නීති (Law) ලෙස කොටස් තුනකි. ජන චර්යා සමූහ පැවැත්ම තීරණය කරන ලාබාලතම නීති රීති වන අතර ගණ චර්යා ඒ පිළිබඳ බරින් වැඩි ප්‍රබල වැඩිමහලු නීති රීති වේ. නීතිය ජන චර්යා හා ගණ චර්යා යන දෙකම පිහිට කොට ගෙන රජය විසින් රචිත ලිඛිත ව්‍යවස්ථා මාලාවකි.

ආචාරධර්ම යනු **''පුද්ගලයින්ගේ හෝ කණ්ඩායම්වල හැසිරීම පාලනය කරන සදාචාරාත්මක මූලධර්මයක් හෝ වටිනාකම් පද්ධතියකි.''**

වෘත්තීය ආචාරධර්මයක් යනු **''නිශ්චිත වෘත්තියක් තුළ හැසිරීම සහ තීරණ ගැනීම මෙහෙය වන සාචාරාත්මක ප්‍රමිතීන් සහ මූලධර්ම වේ.''** ඒ සඳහා පුද්ගල සාරධර්ම හා සමාජ සාරධර්ම යන ද්විත්වයම අඩංගු වේ.

අප මෙහි දී අවධාරණය කරනු ලබන්නේ ළමා ආරක්ෂාවේ නිලධාරීන් විෂයෙහි පැවතිය යුතු වෘත්තීය ආචාරධර්ම පිළිබඳවයි. ඒ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සියලු නිලධාරීන් ඊට අන්තර්ගත වනු ඇත. මෙම නිලධාරීන්ගේ පරිපාලනය, රාජකාරිමය හා වෘත්තීයමය වශයෙන් කොටස් දෙකකි. රාජකාරිමය වශයෙන් නිලධාරීන් පරිපාලනය කිරීමට ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සංග්‍රහය, පැමිණිලි මෙහෙයුම් මාර්ගෝපදේශය හා වෙනත් නීති රීති චක්‍රලේඛන අදාළ වනු ඇත. මෙම ආචාරධර්ම පද්ධතිය ළමා ආරක්ෂාවේ නිලධාරීන්ගේ වෘත්තීයමය අධීක්ෂණය, රාජකාරිමය වගකීම හා වගවීම, ස්වයං පාලනය,සුපරීක්ෂණය, සේවා ප්‍රවර්ධනය, වෘත්තීයභාවය තහවුරු කිරීම හා උසස් පැවැත්ම තහවුරු කිරීම සඳහාද බලපානු ඇත. නමුත් අධිකාරියේ සේවාමය හෝ රාකාරිමය ප්‍රතිපත්ති සැකසීමේ දී මෙන්ම පැවරීම් තීරණය කිරීමේ දී මෙම ආචාර ධර්ම සංග්‍රහය පිටුවහලක් වනු ඇත.

ආචාරධර්ම පිළිබඳ අනවබෝධය, වෘත්තීය සුදුසුකම් සපුරා නොතිබීම, වෘත්තීය නිපුණත්වය සංවර්ධනය කර නොගැනීම,නිසි අධීක්ෂණ හෝ සුපරීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවීම, ස්වයං විනය ආරක්ෂණය, ස්ව සංවර්ධනය නොසලකා හැරීම, වෘත්තීය පෞරුෂ

සංවර්ධනයේ අඩු පාඩු සොයා නොබැලීම හෝ නොපිළිගැනීම, අධිතක්සේරුව හෝ අවතක්සේරුව, ජ්‍යෝෂ්ඨත්වයට හා විශේෂඥ නිපුණතාවයට ගරු නොකිරීම හා කළමණාකාරිත්වය විසින් මූලික ඉලක්ක සහ ප්‍රතිලාභ මනාව හඳුනා නොගැනීම යන හේතු නිසා ආචාරධර්ම බිඳ වැටීමට ලක් විය හැකිය. තවද ළමයින් සමඟ රාජකාරි ඉටු කිරීමට ගොස් සිය සීමාවන් නිවැරදිව සටහන් කරගැනීමට නොහැකි වීමෙන් ඇතැම් ළමයින් හිංසනයට පත්ව ඇත. නිලධාරීන් චූදිතයින් බවට පත්ව ඇත. ළමා ආරක්ෂක පද්ධතියට හානි සිදු වී ඇත. මෙවන් අනිසි ප්‍රතිඵල මැඩ පවත්වා ළමයින් සහ නිලධාරීන් අතර පැවැතිය යුතු සඳතාවයේ සීමා මායිම් හඳුනාගෙන ලෙහෙසියෙන් හා පහසුවෙන් සිය රාජකාරී ඉටු කිරීමට මෙම ආචාරධර්ම පද්ධතිය සියලු නිළධාරීන්ට මඟ පෙන්වනු ඇත. සිය රාජකාරීයේ දී සියළුම නිළධාරීන් හැමවිටම මෙම ආචාරධර්ම පද්ධතියට අනුකූලව සේවය කරනු ඇතැයි බලාපොරොත්තු වේ.

ළමා ආරක්ෂාවට අදාළ නිලධාරීන් ස්වකීය කාර්යය භාරය ඉටු කිරීමේ දී මෙම ආචාරධර්මතා තමන් විසින්ම පනවා ගෙන ඒ අනුව කටයුතු කිරීම අතිශයින්ම වැදගත් වේ. එසේම පිළිගත් ආචාරධර්ම පද්ධතියක් මගින් ළමා ආරක්ෂක වෘත්තීයේ අභිමානය ආරක්ෂා කිරීමත් එම ආචාරධර්ම හිතා මතා උල්ලංඝනය කරන්නන්ට ඒරෙහිව විනයානුකූල කටයුතු කිරීම පදනමක් ගොඩනැගීමත් මෙයින් අපේක්ෂා කෙරේ.

## 02.අරමුණු (Objectives)

1. සේවාලාභියාගේ සුරක්ෂිතභාවය, යහපැවැත්ම හා සංවර්ධනය.
2. නිලධාරියාගේ සුරක්ෂිතභාවය, යහපැවැත්ම හා සංවර්ධනය.
3. ළමා ආරක්ෂණ සේවයේ සුරක්ෂිතභාවය, යහපැවැත්ම හා සංවර්ධනය.
4. ළමා ආරක්ෂණ සේවා ආයතනයේ සුරක්ෂිතභාවය, යහපැවැත්ම හා සංවර්ධනය.
5. ළමා ආරක්ෂක පද්ධතියේ සුරක්ෂිතභාවය, යහපැවැත්ම හා සංවර්ධනය.
6. සමස්ත සමාජයේම සුරක්ෂිතභාවය, යහපැවැත්ම හා සංවර්ධනය.

## 03.අභිප්‍රායන් (Intentions)

1. ප්‍රජාව තුළ ළමා ආරක්ෂණය පිළිබඳ විශ්වාසය, ගෞරවය, තහවුරු කිරීම හා රැක ගැනීම.
2. ළමා ආරක්ෂාවට අදාළ ව්‍යුහාත්මක සැබැදියාවන් අන්‍යෝන්‍ය වශයෙන් සවිබල ගැන්වීම.
3. වෘත්තීය සම්බන්ධතා අර්ථවත්ව පවත්වා ගැනීම හා වැඩි දියුණු කිරීම.
4. ළමා ආරක්ෂක නිලධාරියා හා සේවාලාභියා ඇතුළු සමස්ත ප්‍රජාවටම සිදු විය හැකි අහිතකර තත්වයන් අවම කිරීම සහ වලක්වා ගැනීම හා හිතකර තත්තවයන් තවදුරටත් වැඩි දියුණු කිරීම.
5. ළමා ආරක්ෂක නිලධාරියා විසින් ආචාරධර්ම කඩ කළහොත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා විධිමත් ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම හා එය අඛණ්ඩව පවත්වාගෙන යාම.
6. ළමා ආරක්ෂාව වෘත්තීය රාමුවක් තුළ මෙහෙයවීම.
7. මානව අයිතීන්ට හා අභිමානයට ගරු කිරීම.
8. රහස්‍යභාවය හා විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම

9. පරිපූර්ණ ළමා ආරක්ෂක සේවාවන් පවත්වාගෙන යාම තහවුරු කිරීම.
10. වෘත්තීය දැනුම හා එය භාවිතයේ ගුණාත්මක බව ඉහළ නැන්වීම.
11. සේවයේ සඵලතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ ගැන්වීම.
12. සේවාලාභියාගේ අත්දැකීම්වලට හා සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම
13. සේවා සැපයීමේ දී සාධාරණව හා ප්‍රමාණවත් ලෙස සේවා සැපයීම.

## 04.ප්‍රධාන ආචාරධර්ම මූලධර්ම ( Key Ethical Principles)

ප්‍රධාන ආචාරධර්ම සලකා බැලීමේ දී එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ ප්‍රධාන මූලධර්ම හතර පිළිබඳව අවධානය යොමු කරනු ඇත.

01. ළමයින්ගේ උපරිම යහපත (Best Interest of the Child)
02. සහභාගීත්වය (Participation)
03. පැවැත්ම හා සංවර්ධනය (Survival and development)
04. වෙනස්කොට නොසැලකීම ( Non Discrimination)

## 05. ළමා ආරක්ෂාව හා සම්බන්ධ නිලධාරීන් සතු විය යුතු ආචාරධර්ම (Ethics of officials involved in child protection)

ළමා ආරක්ෂක අධිකාරිය පනත ප්‍රකාරව අධිකාරියේ සියලු සේවකයින් හා නිලධාරීන් ළමා ආරක්ෂණයට අදාළව රජයට උපදෙස් දීම, ළමා අපයෝජනයන්ගෙන් ආරක්ෂාව, ළමා අපයෝජන වැළැක්වීම, නියාමනය, සම්බන්ධීකරණය යන පංචවිධ කාර්යයන් සඳහා කැපවීමෙන්, වගවීමෙන් යුක්තව සෑම නිලධාරියෙකු හා සේවකයෙක්ම ක්‍රියාත්මක විය යුතුය. ඒ සඳහා පහත සඳහන් ආචාරධර්ම අනුව රාජකාරි කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වේ.

### 01. පුද්ගල සාරධර්ම (Personal Values)

I. ළමා ආරක්ෂක අධිකාරියේ සෑම නිලධාරියෙකු තුළම පුද්ගල සාරධර්ම හා හරපද්ධතීන් මත පිහිටා ප්‍රසන්න, ප්‍රියමනාප පෞර්ෂයක්, ස්වයං විනයක්, , මානව දයාව, නිර්ව්‍යාජ කැපවීම, නිහතමානීකම හා විෂයබද්ධ දැනුම, නිපුනතාවයක් තිබිය යුතුය.
II. වෘත්තීමය ගරුත්වය රැකෙන හා සේවාලාභියා කිසිදු ආකාරයකින් අපහසුතාවයට පත් නොවන සමාජ සංස්කෘතික වටිනාකම්වලට එරෙහි නොවන ඇඳුමක් හා විලාසිතාවන් සිය සේවා කාලය තුළ භාවිත කළ යුතුය.
III. ළමයින් හෝ සේවාලාභීන් සමග විමර්ශන, ආවේක්ෂණ, නියාමන, මනෝසමාජීය හා වැළැක්වීමේ ක්‍රියාකාරකම් තුළ නිරත වනවිට ඒ ඒ කාර්යයට වඩාත් ගැලපෙන රහස්‍යතාවය රැකෙන , සමාජයට නිරාවරණය නොවන, සේවාලාභියාට පහසුවක් දැනෙන ස්ථාන තෝරා ගැනීමට සංවේදී විය යුතුයි.
IV. ළමුන් සමග කටයුතු කරන නිලධාරියෙකු ලෙස නිර්මාණශීලී වීම, නම්‍යශීලී වීම, උපායශීලී වීම, තැනට සුදුසු ලෙස කටයුතු කිරීම, ක්ෂණික තීරණ ගැනීම, උපකල්පන හැකියාවෙන් යුතුව, නිරවුල් මනසකින් යුතුව,පූර්ව විනිශ්චයකින් තොරව, සමව, සාධාරණව,සාමූහික හැඟීමෙන් දත්ත මත පිහිටා තීරණ ගෙන ඵලදායී සේවාවක් ලබා දීම.

**02.** වෘත්තීයමය ගුණාත්මකභාවය **(Professionalism)**

I. ළමුන් සමඟ කටයුතු කිරීමේ දී සිය රාජකාරී සීමාව ඉක්මවා කටයුතු නොකළ යුතුය. විශේෂයෙන් ආදරය, දයාව, කරුණාව, මෛත්‍රිය, සෙනෙහස, ප්‍රේමය වැනි ආත්මීය සංකල්ප රාජකාරී සීමාව ඉක්මවා මතු වීමට ඉඩ නොදිය යුතු අතර එයින් තමාට හෝ ළමයාට හෝ ළමා ආරක්ෂක පද්ධතියට අනිසි බලපෑමක් සිදු නොවිය යුතුය.

II. වෘත්තීය ගුණාත්මකභාවය පවත්වා ගැනීම, නිපුණතාවයෙන් වැඩ කිරීම සඳහා දැනුම, ආකල්ප, කුසලතා නිරන්තරයෙන් වර්ධනය කර ගැනීම, නිලධාරීන් සමග සහයෝගයෙන් වැඩ කිරීම, තම සේවාවල ගුණාත්මක භාවය අධීක්ෂණය කර බැලීම හා ළමා හිතකාමී සේවයක් සැපයීම.

III. තම සේවාලාභී ළමයින්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, ආකල්ප, කුසලතා සාක්ෂාත් කර ගැනීම සඳහා එක් එක් ළමයාගේ ප්‍රශස්ත වර්ධනයට සහ සංවර්ධනයට පහසුකම් සැලසීම සහ ප්‍රජා පාදක ළමා ආරක්ෂණ ක්‍රමවේදයන් දිරිමත් කිරීම.

**03.** වගකීම් සහගත මාධ්‍ය භාවිතය **(Responsibility in using Media)**

I. මාධ්‍ය භාවිතයේ දී තමාට හානි නොවන ලෙස, වෙනත් කෙනෙකුට හානි නොවන ලෙස හා සමාජයට හානි නොවන අයුරින් මාධ්‍ය භාවිත කළ යුතු අතර විශේෂයෙන් සමාජ මාධ්‍ය භාවිතයේ දී සිය රාජකාරී ප්‍රතිරූපයට හානි වන ලෙස හෝ ආයතනයේ කීර්තිනාමයට හානි වන ලෙස හෝ ළමා ආරක්ෂණ පද්ධතියට හානි වන ලෙස කටයුතු නොකල යුතු අතර සිය සේවා ලාභීන්ගේ පුද්ගලික සන්නිවේදන උපකරණ හෝ සමාජ මාධ්‍ය සමඟ රාජකාරී අවස්ථාවලට හැර වෙනත් කිසිදු සබඳතාවයක් පවත්වාගෙන නොයා යුතුය.

II. ළමයින් සම්බන්ධ කරගෙන සිදු කරන සියලු වැඩසටහන්වල දී ළමුන්ගේ මුහුණු හා අනන්‍යතාවය අනාවරණය නොකළ යුතුය.

**04.** අයුතු වරප්‍රසාද **(Unfair Privilege)**

I. බාහිර ආයතන සංවිධාන, පුද්ගල මණ්ඩල, හා පුද්ගලයින් සමඟ රාජකාරිමය කටයුතු කිරීමේ දී අධිකාරියේ ගරුත්වය රැකෙන පරිදි සිය සබඳතා පවත්වාගෙන යායුතු අතර තම සේවාලාභීන් සිය කැමැත්තෙන් වුවද ලබාදෙන කිසිදු ත්‍යාගයක්, පරිත්‍යාගයක් හෝ සංතෝසමක් භාර නොගත යුතුය. යම් පරිත්‍යාගයක් වේ නම් ඒවා ළමා ආරක්ෂණ අරමුදල වෙත යොමු කිරීමට දිරිමත් කළ යුතුය.

II. තම රාජකාරියේ බලය භාවිත කරමින් හෝ වෙනත් යම් ක්‍රමයකින් කිසිදු ළමයෙකුගෙන් වරප්‍රසාද, ලාභ ප්‍රයෝජන බලාපොරොත්තු නොවීම හා

නිළධාරියාගේ පුද්ගලික කටයුතුවලට ළමයින් සහභාගී කර නොගැනීම මෙන්ම නිලධාරියාගේ රුචි අරුචිකම් අනුව ළමයින්ව හැඩ ගැස්වීම හෝ මෙහෙයවීම නොකල යුතුය.

**05.** අවංකභාවය හා සද්භාවය **(Honesty and Good faith)**

I. ළමුන් සඳහා සේවා සැපයීමේ දී ලාභ ප්‍රයෝජනවලින් මුක්තව, අපක්ෂපාතීව, ස්වාධීනව, බාහිර බලපෑම්වලින් තොර වූ පූර්ව නිගමනවලින් හා අගතිදායක වීමෙන් බැහැරව, විනිවිදභාවයෙන් හා සත්භාවයෙන් යුක්තව කටයුතු කිරීම.

**06.** විශ්වාසනීයත්වය**(Reliability)**

I. වින්දිත ළමයා හෝ ළමයින් සතුටු කිරීමට හෝ ළමයා තුළ විශ්වාසය ගොඩ නැගීම උදෙසා අධිකාරියට කළ නොහැකි කාර්යයන් ප්‍රකාශ කරමින් ළමයා මවිත නොකළ යුතු අතර සෑම විටම විය හැකි සත්‍ය දේ සඳහා ළමයා සහ ළමයාගේ භාරකරුවන් සූදානම් කළ යුතුය. එසේම ළමයා තුළ ගොඩ නැගූ විශ්වාසය කිසිදු විටෙක පලදු නොකල යුතුය.

**07.** පැමිණිලි මැදිහත්කරණය හා සම්බන්ධ ආචාරධර්ම **(Ethics relating to the complaint Intervention)**

I. ළමා හිතකාමී පැමිණිලි ක්‍රමවේදයක් පවත්වාගෙන යා යුතු අතර ළමා අපයෝජන පැමිණිලි සඳහා මැදිහත්කරණයේ දී නිළධාරියාගේ මිතුරන්, පවුලේ සාමාජිකයින්, හෝ පැමිණිල්ලට අදාළ නොවන කිසිදු පුද්ගලයෙක් සම්බන්ධ නොකර ගත යුතුය.

II. පැමිණිලි විමර්ශන, නියාමන, අධීක්ෂණ හෝ ආවේක්ෂණ හා අනෙකුත් රාජකාරිමය කටයුතුවල දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පැමිණිලි මෙහෙයුම් මාර්ගෝපදේශය හා අනිකුත් මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීම.හා දින සටහන් නොකඩවා යාවත්කාලීන කිරීම.

III. තමාට අදාළ පුද්ගලික පැමිණිල්ලක් තමා විසින් විමර්ශනය නොකළ යුතුය.

**IV.** වින්දිත ළමයින් නීතිමය කටයුතුවලට සම්බන්ධකර ගැනීමේ දී ඒ ළමයාගේ ආරක්ෂාව, රැකවරණය තහවුරු කිරීම, ආරක්ෂක ක්‍රියාපටිපාටි හා හදිසි ප්‍රතිචාර සැලසුම් කිරීම පිළිබඳ කටයුතු කිරීම හා කිසි ලෙසකින් ළමයා සහ සැකකරු මුණගැසීමට ඉඩ ප්‍රස්තා ලබා නොදිම.

**08.** වාර්තාකරණය**(Reporting)**

I. සිය රාජකාරියට අදාළ ළමයින් හා සම්බන්ධ තොරතුරුවල රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා කිරීම හා තොරතුරු හා වාර්තා නිවැරදිව පවත්වාගෙන යාම හා අප්‍රමාදව සුදුසුම ආයතනය හා නිලධාරියා වෙත වාර්තා කිරීම.

**09.** වෙනස්කොට නොසැලකීම **(Non-discrimination)**

I. කිසිදු ආකාරයක සමාජ, ආර්ථික, තත්තවය, ආගම, කුලය, ජාතිය, වර්ණය, භාෂාව, ස්ත්‍රී පුරුෂබව, ලිංගිකත්වය, ආබාධිතබව, සෞඛ්‍ය තත්වය, සංස්කෘතිය හා නෛතික ආදී වශයෙන් වන මොනම ආකාරයේ හෝ වෙනස් කොට සැලකීමකින් තොරව ළමුන්ට සේවය ලබා දීම.

**10.** වින්දිත රැකවරණය**(Victim protection)**

I. තම බල ප්‍රදේශයේ ප්‍රචණ්ඩත්වයට, සූරාකෑමට හා සියලු ආකාරයේ කායික, මානසික, ලිංගික හෝ නොසලකා හැරීම්වලට ළමයින් ගොදුරු වීම වැළැක්වීමට සියලු පියවර ගැනීම හා එවැනි අපයෝජනයන්ට ගොදුරු වූ වින්දිත ළමයින් ආරක්ෂා කිරීම සඳහා නිළධාරී මට්ටමෙන් සියලු පියවර ගැනීම හා ප්‍රතිකාර සඳහා සම්බන්ධීකරණය සැලසීම හා ද්විතීක වින්දිත භාවයන්ට පත් නොවීමට වගබලා ගැනීම.

**11.** අගය කිරීම හා ගරු කිරීම **(Appreciation an respect)**

I. ළමුන් සමග වැඩ කිරීමේ දී ළමයාගේ ජීවිතයට බලපෑමක් ඇති වන යම් තීරණයක් ගැනීමට පෙර හැකි සෑම විටම ළමයාගේ මතයට ඇහුම්කම් දීම හා ළමයා මනෝමීය වශයෙන් පාලනය නොකිරීම.

II. සෑම ළමයෙකුටම ඔහුගේ / ඇයගේ පවුල, පාසල, සමාජය හා ප්‍රජාවේ සාමාජිකයෙකු ලෙස අගය කිරීම හා ගරුකිරීම මෙන්ම ඔහුගේ / ඇයගේ ස්වභාවික බැදීම් හා දෙමාපිය, සහෝදර සහෝදරියන්ට, භාරකරුවන්ට හා අනෙකුත් සාමාජිකයින්ට හා සබඳතාවයන්ට ගරු කිරීම මෙන්ම ළමයාගේ අදහස් හා විශ්වාසවලට ගරු කිරීම.

III. ළමයාගේ පවුලට ඇති පරම අයිතියට ගරු කරමින් ළමයා පවුලෙන් ඉවත් කිරීම වෙනුවට ළමයාට පවුල තුළ ඇති අවධානම අවම කිරීම සඳහා උචිත පියවර ගැනීම

**12.** අපයෝජනයෙන් ආරක්ෂා කිරීම හා අයිතිවාසිකම් ආරක්ෂාව **(Protection from abuse and protection of rights)**

I. ළමයාට වන අපයෝජන / අයිතිවාසිකම් කඩවීම හා ගැටළු වළක්වා ගැනීමට අවශ්‍ය ආරක්ෂාව ලබා දීම

**13.** තොරතුරුවල රහස්‍යභාවය **(confidentiality of information)**

I. රාජකාරීමය වශයෙන් ඔබ වෙත ලැබෙන සියලු තොරතුරු අවභාවිතයේ නොයෙදීම මෙන්ම ඒවායේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම.

**14. නීති රීතිවලට අනුකූල වීම හා රාජකාරිමය විනය (Compliance with rules and regulations and Duty discipline)**

I. ළමයින්ගේ ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය, සහභාගීත්වය යන සියලු අංශයන්ගේ නීති, රීති, පනත්, ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ, චක්‍රලේඛ, ආචාරධර්ම සියල්ල පිළිබඳව අවබෝධයෙන් හා හැමවිටම ඊට අනුකූලව සේවය සැපයීම.

II. රාජකාරීමය හා නිත්‍යානුකූල උපදෙස්වලට අනුකූල වීම, අත්තනෝමතිකව කටයුතු නොකිරීම හා ගැටළුකාරී අවස්ථාවල දී ඉහළ උපදෙස් පැතීම.

III. තම අධීක්ෂණය යටතේ හෝ රාජකාරීමය බැඳීමක් පවත්නා නිලධාරියෙකු හෝ සේවකයෙකු ළමා ආරක්ෂක නීති/ප්‍රතිපත්තිවලට බැහැරව කටයුතු කරයි නම් ඒ පිළිබඳව ඉහළ අධිකාරියට නොපමාව දැනුවත් කිරීම.

IV. ළමා ආරක්ෂාවට තරඟකාරිත්වය නොමැත. එකා පරයා එකා කැපී පෙනීමට හෝ අනෙකා අවතක්සේරු කිරීම හෝ කේලම් කීම, කේලම් ඇසීම, නොමැතිව මධ්‍යස්ථව හා සහෝදර නිලධාරීන් සමඟ සහෝදරත්වයෙන්, සහයෝගයෙන්, සංවේදීව, හා සහකම්පනයෙන් යුතුව ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව වැඩ කිරීම.

**15. සහභාගීත්වය (Participation)**

I. ළමයින් සහභාගීකර ගැනීමේ දී ළමයින් රවටා, අලංකාරයට, නාමික ලෙස සහභාගී කර නොගැනීම.

II. ළමා සහභාගීත්වයේ දී ළමයින් ආරම්භ කර, තීරණ වැඩිහිටියන් සමඟ බෙදා ගෙන සහයෝගයෙන් විශ්වාසයෙන් යුතුව අර්ථාන්විත ළමා සහභාගීත්වයක් සඳහා ක්‍රමයෙන් ළමයින්, නිලධාරීන්, සමාජය හා ප්‍රජාව උනන්දු කරලීම.

**16. උපරිම යහපත (Best interest)**

I. ළමයින් සමඟ කටයුතු කිරීමේ දී හා සේවා සැපයීමේ දී හෝ මැදිහත්කරණයේ දී හා තීරණගැනීමේ දී ළමයාගේ කායික හා මානසික යහපැවැත්ම ප්‍රමුඛ කර ගනිමින් ළමයාගේ උපරිම යහපත සලකා බලා කටයුතු කිරීම.

**17. ළමයින්ට ප්‍රමුඛස්ථානය (Children First )**

i. හදිසි සහ ආපදා තත්තවයන්වල දී ළමුන්ට ප්‍රමුඛස්ථනය ලබා දීම හා හොඳම දේ ළමයින්ට වැනි සංකල්පවලට අනුකූල වෙමින් හැමවිටම ළමයා ප්‍රමුඛ කර ගත් සේවයක් සැපයීම.

## 18. ළමා ආරක්ෂාවේ සීමා මායිම් හඳුනාගැනීම(Identifying The Boundaries of Child Protection)

I. තම බල ප්‍රදේශයෙන් බැහැරව යම් රාජකාරිමය කටයුත්තක් සඳහා යෙදෙන්නේ නම් ඒ පිළිබඳව ඉහළ නිලධාරීන්ගේ විදිමත් අනුමැතිය ලබා ගැනීම හා අදාළ ප්‍රදේශයේ නිලධාරියාට දැනුම් දීම.

II. තම රාජකාරි සීමා මායිම් හඳුනා ගැනීම සහ ඊට අනුකූලව පමණක් කටයුතු කිරීම.

III. ළමුන් සමග කටයුතු කරන පරිවාස නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලදාරීන්, මුල් ළමා විය සංවර්ධන නිලධාරීන් උපදේශන නිලදාරින් ඇතුළු අනෙකුත් නිලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

IV. වෙනත් පුද්ගලයෙකුගෙන්, නිලධාරියෙකුගෙන්, ආයතනයකින් යම් සේවාවක් ළමා ආරක්ෂණයට ලබා ගන්නා සෑම විටම ඔහුගේ/ඇයගේ / නිලධාරියාගේ / ආයතනයේ ප්‍රමානවත් සුදුසුකම් හා පළපුරුද්ද සපුරා ඇද්ද යන්න සලකා බැලීම සහ බැඳියාවන් අතර ගැටුම් ඇති නොවන ආකාරයට කටයුතු කිරිම.

V. ළමා ආරක්ෂාවට අදාළ යම් ඉගැන්වීමක්, පුහුණු කිරීමක්, සේවා ලබාදීමක් හෝ අධ්‍යාපනය ලබාදීමක් ඔබ පෞද්ගලිකව සිදු කරන්නේ නම් රාජකාරී වේලාව තුළ සිදු නොකිරීම.

VI. ළමා ආරක්ෂාවට අදාළ යම් ඉගැන්වීමක්, පුහුණු කිරීමක්, සේවා ලබාදීමක් හෝ අධ්‍යාපනය ලබාදීමක් සඳහා අධිකාරියට සෘජුව ලැබෙන ඉල්ලීම්වල දී ඉහළ කලමණාකාරීත්වයේ අනුමැතිය මත පමණක් සහභාගී වීම සහ යම් දීමනාවක් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ නිර්දේශ සහිතව අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම.

VII. ඒක් එක් නිලධාරියාගේ රාජකාරී විෂය පථයට අනිසි ලෙස බලපෑම් නොකිරීම.

## 19. මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම (Mental Health and Well being)

I. ළමා ආරක්ෂාව, ළමා අපයෝජන, අපචාර, ප්‍රචණ්ඩත්වය වැනි සංවේදී මානව චර්යාවන් පිළිබඳව දිගින් දිගටම කටයුතු කිරිමේ දී තම මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම සම්බන්ධයෙන් අවධානයෙන් සිටීම.

II. තම මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම දුර්වල විය ඇති බව හැඟී යා නම් තම රාජකාරියෙන් ඉවත් වී ඉහළ කළමණාකාරීත්වය දැනුවත් කිරිම.

## 20. වැඩසටහන්වල ප්‍රමිතිය හා ගුණාත්මකභාවය (Standard and Productivity of programs)

**I.** ළමා ආරක්ෂණ විෂයට අදාළ වැඩසටහන්, පුහුණුවීම්, දැනුවත් කිරීම්, අධ්‍යාපනය ලබා දීම්, ආදිය පිළිගත් පරිචයන්වලට අනුකූලව නිසි ප්‍රමිතීන් සහ ඉහළ ගුණාත්මකභාවයෙන් යුතුව සකස්කොට භාවිත කිරීම.

**21.** **ආචාරධර්ම ආරක්ෂා කිරීම (Protection Of Ethics)**

I. අධිකාරියේ සියලු නිලධරයන් හා සේවකයින් මෙම ආචාරධර්ම පද්ධතිය පිළිබඳ දැනුම අවබෝධය ලබා ගත යුතු අතර මෙහි කිසිවක් නොදැන සිටීම නිදහසට කරුණක් නොවනු ඇත.

II. තවද යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු මෙම ආචාරධර්ම බිඳ හෙළන්නේ නම් ඒ පිළිබඳ ඉහළ කළමණාකාරීත්වය දැනුවත් කිරීම සියළු නිලධාරීන්ගේ වගකීමයි.

22. **මෙම ආචාරධර්ම පද්ධතියේ යම් කරුණක් කඩ කිරීම විනයානුකූලව කටයුතු කිරීමට හේතුවක් වේ.**

ප්‍රීති ඉනෝකා රණසිංහ
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

ආශ්‍රිත මූලාශ්‍ර

- 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක පනත
- 1939 අංක 48 දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත,
- ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2017),
- ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පැමිණිලි මෙහෙයුම් මාර්ගෝපදේශය,
- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය (Children's Charter)

## Key References


- UNCRC, 1989 – UNICEF Convention on the Rights of the Child
- CPMS, 2019 – Child Protection Minimum Standards by The Alliance
- ERIC Guidelines, 2013 – Ethical Research Involving Children
- Lansdown, G. (2005). *The Evolving Capacities of the Child*
- Keeping Children Safe (2014). *International Child Safeguarding Standards*
- Munro, E. (2011). *The Munro Review of Child Protection*
- UNESCO. (2018). Intercultural Competences: Conceptual and Operational Framework. Paris: United Nations Educational, Scientific and Cultural Organization (UNESCO).
  - Retrieved from: https://unesdoc.unesco.org/ark:/48223/pf0000262344
- UNICEF. (2019). Ethical Guidelines for the Ethical Reporting and Use of Images and Messages Involving Children. New York: United Nations Children's Fund (UNICEF).
  - Retrieved from: https://www.unicef.org/documents/unicef-ethical-guidelines